# වැවිලි සංවර්ධන ව්‍යාපෘතිය සහ වතු ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය II
**55/75, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.**

ව්‍යාපෘතිය සඳහා දායකත්වය: වැවිලි සංවර්ධන ව්‍යාපෘතිය (වැ.සං.ව්‍යා.) සඳහා මුදල් ආධාර ලබා දීම

ආසියානු සංවර්ධන බැංකුව මගින්

: ජපන් අන්තර්ජාතික සහයෝගිතා බැංකුව මගින් වතු ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය සඳහා අධාර ලබා දීම

ආධාර ක්‍රමය : ණය ආධාර

ව්‍යාපෘති කාල සීමාව : 2003-2008

ව්‍යාපෘතියේ මූල්‍ය වටිනාකම : ඇ. ඩොලර් මිලියන 140.8

ව්‍යාපෘතියේ අභිමතාර්ථ : වතු සමාගම් විසින් පාලනය වන වතුවල දිගුකාලීන තිරසාර පැවැත්ම

ස්ථාපිත කිරීමයි.

මෙම ව්‍යාපෘතිය මගින් වැවිලි සමාගම් 20ක් සහ රජයට අයත් ඇල්කඩුව, කුරුණෑගල සහ හලාවත වැවිලි සමාගම් සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් වතුද ආවරණය කෙරේ. ඒ අනුව පරිපාලන දිස්ත්‍රික්ක 14ක මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ.

## ව්‍යාපෘතියේ අරමුණු

අ) වැවිලි සංවර්ධන ව්‍යාපෘතිය

- වැවිලි අංශයේ වතු ප්‍රාථමික නිෂ්පාදකයන්ගේ මට්ටමේ සිට කෘෂි ව්‍යාපාර මට්ටමට පත්කිරීම මගින් වතුවල ඵලදායීතාවය වැඩි කිරීම.
- වතු සේවකයන්ගේ ජීවන මට්ටම සහ වැඩකරන පරිසර තත්ත්ව, අනෙකුත් ක්ෂේත්‍රවල මට්ටමට උසස් කිරීම.

ආ) වතු ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය II

- වතු සේවකයන්ගේ ජීවන මට්ටම සහ වැඩකරන පරිසර තත්ත්ව දියුණු කිරීම.

## ක්‍රියාකාරකම්

- අලුත්/ නැවත වගාවන් කර්මාන්තශාලා ප්‍රතිසංස්කරණ සහ භෝග/ භෝග නොවන විවිධාංගීකරණය.
- වතුවල කළමනාකරණ සේවක කම්කරු යන සියලුම කොටස් සඳහා තාක්ෂණික දැනුම ලබා දීමට පුහුණු කිරීම.
- තේ කර්මාන්තශාලාවලට ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා අවශ්‍ය තත්ත්ව සහතික (HACCP/ISO 22000) ලබා ගැනීමට සහ කර්මාන්තශාලාවල අවශ්‍ය සුලු අලුත්වැඩියාවන් සඳහා 60% දායකත්වය.
- සේවක නිවාසවල වහල ප්‍රතිසංස්කරණය, ක්ෂේත්‍ර සහ කම්හල් විවේකාගාර, සමාජ සංවර්ධන මධ්‍යස්ථාන සහ ක්‍රීඩාපිටි වැනි ඉදිකිරීම් සහ වතුවල ක්ෂේත්‍ර කටයුතු පහසුකරන දලු කඩන යන්ත්‍ර, කතුරු, තේ කප්පාදු කරන යන්ත්‍ර, රෝද 2 ට්‍රැක්ටර්, පස් කපන යන්ත්‍ර, රබර් කිරි ප්‍රවාහනය සඳහා බවුසර් ආදී උපකරණ සඳහා 60%ක දායකත්වය.
- වතු කම්කරුවන්ගේ සමාජ සංවර්ධනයට බලපාන සාමාජීය ගැටළු, ස්ත්‍රී පුරුෂ භේද අනුව සැලකීමේදී ඇතිවන ගැටළු පිළිබඳ අවබෝධය ලබාදීමේ වැඩසටහන් මගින් ඔවුන්ගේ ජීවන මට්ටම උසස් කිරීම සහ දුප්පත්කම අවම කිරීම සහ වතු අභ්‍යන්තර පාරවල් කි.මී. 2,000ක් පමණ අලුත්වැඩියා කිරීම සඳහා 100% ක දායකත්වය ලබා දීම.

**සම්බන්ධවිය හැකි පුද්ගලයන්**

| නම | දුරකථන අංකය | ෆැක්ස් | ඊ - මේල් |
|---|---|---|---|
| ව්‍යාපෘති අධ්‍යක්ෂ, ආර්.එම්. ප්‍රේමදාස මහතා | 2304176 | 2421573 | progen@sltnet.lk<br>rajaprem@sltnet.lk |